# ඇබෑර්තු

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## (පූර්ණ වශයෙන් රජය සතු සමාගමකි)

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

### සමාගමෙහි පවතින පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සහකාර පතල් නායක - අභ්‍යාසලාභී**

**1.1 සුදුසුකම් :**

අ.පො.ස. උ/පෙ විභාගය, ගණිතය හෝ නව විෂය නිර්දේශයෙහි ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් සාමාර්ථ 03ක් ලබා ගැනීම

**සහ**

අ.පො.ස. සා/පෙ විභාගයෙහි ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**1.2 වැටුප් පරිමාණය**

අභ්‍යාසලාභී දීමනාව - රු. 50,540/- මාසිකව

වසරක පුහුණු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු සහකාර පතල් නායක තනතුර සඳහා පහත සඳහන් වැටුප් පරිමාණයට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

MA21: රු. 50,540.00-10X540-7X630-4X890-20X1,1190-87,710.00

ජීවන වියදම් දීමනාව, දිනපතා පැමිණීම මත පදනම්ව මාසික ආහාර දීමනාව සහ රජයේ චක්‍ර ලේඛනයන්ට අනුකූලව අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ඇතුළත් වේ.

**1.3 වයස් සීමාව**

වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට වැඩි නොවිය යුතුය.

**සැම අයදුම්කරුවකුම**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. ශාරීරික සහ මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**අනෙකුත් ප්‍රතිලාභ**

1. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 10%ක් වන අතර, සේව්‍යයා විසින් 15%ක (සේවා නියුක්තයන්ගේ භාර අරමුදල 3% ද ඇතුළත්ව) දායකත්වය දරයි.
2. සේවක රක්ෂණ යෝජනා ක්‍රමය
3. අවශ්‍යවේනම් නවාතැන් පහසුකම් සැපයිය හැක.

**සැලකිය යුතුය.**

සහකාර පතල් නායක (අභ්‍යාසලාභී) ඇබෑර්තුව පවතින්නේ දෙඩම්ගස්ලන්ද පතල් පරිශ්‍රයේ වේ.

පතල් කර්මාන්තයේ හෝ නිෂ්පාදන කර්මාන්තයක සුපරීක්ෂක මට්ටමේ පළපුරුද්ද තිබීම අමතර වාසියක් වේ.

කරුණාකර ඔබගේ අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත්ද සමග පහත සඳහන් ලිපිනය වෙත, 2025.06.27 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි **"සහකාර පතල් නායක - අභ්‍යාසලාභී"** යනුවෙන් තනතුර සැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්,**
**561/3 ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ - 05.**